# 4 ශ්‍රේණිය පරිසරය වැඩපොත

## අංක 15 ( පිළිතුරු සහිතයි )

**(2020 නව නිර්දේශය 15 - මිනිසා සහ තොරතුරු)**



**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**

{15 ඒකකය - මිනිසා සහ තොරතුරු :
විෂය නිර්දේශය සහ ගුරු මාර්ගෝපදේශය
ආවරණය වන පරිදි සකස් කර ඇත. }

# 15. තේමාව- මිනිසා සහ තොරතුරු

"සමාජයේ ජීවත් වන පුද්ගලයකු ලෙස අවට ලෝකයේ තොරතුරු පිළිබඳ දැනුම්වත් ව සිටීම වැදගත් වේ. සමාජ, දේශපාලන, ආර්ථික හා ආගමික තොරතුරු පිළිබඳ යාවත්කාලීන දැනුමකින් යුතු ව සිටීම ද වැදගත් ය. වර්තමානයේ තොරතුරු ලබා ගත හැකි මාධ්‍ය බොහෝ ය. විද්‍යුත් මාධ්‍ය හා ලිඛිත මාධ්‍ය සන්නිවේදන මාධ්‍ය අතර ප්‍රධාන ය. මෙවැනි මාධ්‍ය භාවිතයෙන් තොරතුරු හුවමාරු කර ගැනීමේ අවස්ථා මෙන් ම යමක් මැනවින් වාචික ව සන්නිවේදනය කර ගැනීමේ අවස්ථා ද ප්‍රායෝගික ව අත්විඳීමට සිසුන්ට අවස්ථා සැලසීම මෙම තේමාවෙන් අපේක්ෂිත ය."

- **ඉගෙනුම් පල**
  - අතීතයේ දී තොරතුරු හුවමාරු කරගත් ආකාර පිළිබඳ ව විමසා බලයි.
  - විවිධ ක්‍රම අනුගමනය කරමින් තොරතුරු වාර්තා කරයි.
  - අන් මත ඉවසමින් තම අදහස් සහනශීලී ව ප්‍රකාශ කරයි.
  - විවිධ සන්නිවේදන මාධ්‍ය හා සන්නිවේදන උපකරණ හඳුනා ගෙන භාවිත කරයි.
  - එම උපකරණ නිවැරදි ව භාවිත කරන ආකාර පිළිබඳ අත්දැකීම් ලබයි.
  - විවිධ මාධ්‍ය ඇසුරෙන් ලැබෙන තොරතුරු විශ්ලේෂණය කර උචිත තොරතුරු තෝරා ගනියි.
  - තොරතුරු සන්නිවේදනය සඳහා යොදා ගන්නා ක්‍රමවේද සහිත පෝස්ටර් නිර්මාණය කරයි.
  - දෙන ලද විධානවලට අනුව කටයුතු කරමින් ඇවිදීම, දිවීම සහ නැවතීමේ ක්‍රීඩා හා ක්‍රියාකාරකම් සිදු කරයි.
  - නිවැරදි සන්නිවේදනයේ දී පවත්වා ගත යුතු ගුණාංග නිරූපණය කරමින් වින්දනයක් ලබයි.

**01) මිනිසා සන්නිවේදන සත්ත්වයෙක් මෙන්ම සමාජීය සත්ත්වයෙකි. එබැවින් නිතර සමූහයක් ලෙස ජීවත් වීම ප්‍රිය කරයි. තනිව හෙවත් හුදෙකලා ව ජීවත් වීම ප්‍රිය නොකරයි. සමූහයක් ලෙස ජීවත් වීමේ දී සමූහයේ සාමාජිකයන් අතර ද, සමූහ අතර ද සන්නිවේදනය කරීමේ යම් ක්‍රමයක් අවශ්‍ය විය. ඒ වෙනුවෙන් සන්නිවේදන ක්‍රම බිහි විය. ඔබ ඉගෙන ගත් පරිදි සන්නිවේදනය යනු කුමක් ද ? .**

.................................................................................................................................

**02) අතීතයේ ජීවත් වූ මිනිසා සන්නිවේදනය සඳහා යොදා ගත් ක්‍රම මොනවා ද ?.**

1. .........................................................................
2. .........................................................................
3. .........................................................................
4. .........................................................................
5. .........................................................................
6. .........................................................................



**03) මුහුණේ ඉරියව් මගින් කෙබඳු හැඟීම් ප්‍රකාශ කල හැකි ද ?**

1. ........................................ 2. ........................................
3. ........................................ 4. ........................................
5. ........................................ 6. ........................................

**04) සන්නිවේදනයක් සිදු වීමට / සිදු කිරීමට අත්‍යවශ්‍ය අංග තුන මොනවා ද ?**

1. ............................ 2. ............................ 3. ............................

**05) ලිපියක් යැවීමේදී ඊට අදාලව ඉහත අත්‍යවශ්‍ය අංග තුන මොනවා ද ?**

1. ලියුම ලියන්නා - ....................................
2. ලියුම - ....................................
3. ලියුම ලබන්නා - ....................................

06) සිසුන් කණ්ඩායම් ලෙස රඟදැක්වීම මගින් සන්නිවේදනය කෙසේ සිදු වන්නේ දැයි අත්දැකීමට ඔබ සිදු කළ ලිපියක් යැවීමේ ක්‍රියාකරමේදී (නාට්‍යාකාරයෙන් අනුකරණය) සිසුන්ට රඟපෑමට සිදුවූ විවිධ අවස්ථා මොනවා ද ?

1. ලියුමක් ලිවීම.
2. තැපැල් කන්තෝරුවට යාම.
3. මුද්දර මිල දී ගැනීම.
4. ........................................
5. ........................................
6. ........................................
7. ........................................
8. ........................................

07) කණ්ඩායමක් ලෙස කටයුතු කරන විට තම අදහස් ප්‍රකාශ කිරීමට ලැබෙන අවස්ථා මොනවා ද ?

1. ........................................
2. ........................................
3. ........................................
4. ........................................
5. ........................................

08) තම අදහස් ප්‍රකාශ කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු මොනවා ද ?

1. ........................................
2. ........................................
3. ........................................
4. ........................................
5. ........................................

09) නූතන සන්නිවේදන ක්‍රම මොනවා ද ?

1. ........................................
2. ........................................
3. ........................................
4. ........................................
5. ........................................
6. ........................................



10) පරිගණකය හරහා තොරතුරු හුවමාරු කර ගත හැකි ක්‍රම මොනවා ද ?

1. ........................................
2. ........................................
3. ........................................
4. ........................................
5. ........................................

11) තොරතුරු සොයාගන්නා විවිධ ක්‍රම දක්වන රූප සටහන් අභ්‍යාස පොතේ ඇඳ නම් කර පාට කරන්න. කණ්ඩායම් ලෙස අනුමානය/ආදර්ශනය කර දක්වන්න.

12) තොරතුරු ලබා ගන්නා ආකාර කණ්ඩායම් ලෙස අනුමානය / ආදර්ශනය කර දැක්වීමේ ක්‍රියාකාරකමට අදාලව විවිධ මාධ්‍ය වලින් ලබා ගන්නා තොරතුරු පිළිබඳ ව දී ඇති සටහනේ හිස් තැන් සම්පූර්ණ කරන්න.

1. ගුවන් විදුලිය - ප්‍රවෘත්ති කියවීම/ඉදිරිපත් කිරීම

......................................................................................................

2. රූපවාහිනිය - ......................................................................................................

......................................................................................................

......................................................................................................

3. අතින් ගෙන යා හැකි දුරකථන භාවිත කරන අවස්ථා - ......................................................

......................................................................................................

4. පරිගණකය/උකුළු පරිගණකය.(TAB) - ......................................................................

......................................................................................................

13) විවිධ මාධ්‍ය වලින් තොරතුරු ලබා ගන්නා ආකාරය අනුව සුදුසු සන්නිවේදන මාධ්‍ය ලියන්න.

1. ශ්‍රව්‍ය මාධ්‍ය (ඇස) - ......................................................................................................

......................................................................................................................................

2. දෘශ්‍ය මාධ්‍ය (කන) - ......................................................................................................

......................................................................................................................................

3. ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය (ඇස හා කන) - ..........................................................................

......................................................................................................................................

14) සන්නිවේදනය පාඩම අවසානයේ සිදු කල ක්‍රියාකාරකම ඇසුරෙන් හිස්තැන් පුරවන්න.

1. පන්තියේ සිසුන් සමාන කණ්ඩායම් ................................ බෙදන්න.

2. එක් කණ්ඩායමක් .................. රවුමක් තුළත්, අනෙක් කණ්ඩායම තරමක .............. රවුමක් තුළ ද සිටුවා පිටත රවුමේ සිටින සිසුන්ට ඇතුළත රවුමෙන් යහළුවකු වෙන් කරන්න.

3. මෙම රවුම් දෙකෙහි සිටින ක්‍රීඩකයන් ......................... දෙසට ගමන් කල යුතු යි. ක්‍රීඩකයන්ට ගමන් කිරීමට රවුම් දෙක ගුරුවරයා විසින් අඳිනු ඇත. රවුම් දෙක අතර පරතරය මීටර 3ක් පමණ වන සේ සහ පිට රවුමේ විෂ්කම්භය මීටර 10ක් පමණ වේ නම් වඩාත් සුදුසු ය.

4. ගුරුවරයාගේ පළමු සංඥාවට කණ්ඩායම් දෙක ම අඳින ලද රවුම තුළ ....................... දිශාවට ඇවිදීම.

5. දෙවන සංඥාවට අනුව .................. රවුමේ සිටින අය පමණක් ................ රවුමේ සිටින තම යහළුවා වෙත දුවගොස් යහළුවා සොයා ඉක්මනින් බිම වාඩි වීම.

6. ඉක්මනින් ............................................................ ජයග්‍රහණය කරනු ඇත.

15) මෙම තේමාව සඳහා 4වන ශ්‍රේණියේ සිසුන් වෙනුවෙන් සම්පාදනය කරන ලද සමාජ ඒකාබද්ධතා සංකල්ප සහිත ළමා කතා සංග්‍රහයෙහි "ගම්මැද්දේ කලබලේ" කතාව කියවන්න. (මෙම කතාවේ Pdf ලබා ගැනීමට අවශ්‍ය නම් face book ඔස්සේ 3 in 1 group එකට සම්බන්ධ වන්න.)

# 15 තේමාව - පිළිතුරු පත්‍රය.

01) අදහස්, තොරතුරු හා ආකල්ප එක් පුද්ගලයෙකුගෙන් තවත් පුද්ගලයෙකුට යැවීම වේ. එනම්, වාචිකව හෝ අවාචිකව තොරතුරු, අදහස් හා විස්තර ආදිය එකිනෙකා අතර හුවමාරු කර ගැනීමයි.

02) 01. අංග චලන/කතාබහ/කටින් කට.
02. හූ කීම.
03. අණ බෙර වැයීම.
04. කොඩි එසවීම.
05. ගිනි ගොඩක් ගැසීම.
06. සතුන් මගින් (අශ්වාරෝහක, පරෙවි, හංස වැනි පක්ෂීන් මගින්)
07. ඊතල විදීම, ඝණ්ටාරය නාද කිරීම. ........වැනි ක්‍රම.

03) 01. සතුට 02. ශෝක්‍ය 03. බය
04. තරහව 05. ශාන්ත ගතිය 06. වීරත්ව, පිළිකුල. ........ආදිය.

04) 01. යවන්නා 02. මාධ්‍යය 03. ලබන්නා

05) 01. යවන්නා 02. මාධ්‍යය 03. ලබන්නා

06) 04. ලිපි කවරය තුළ ලියුම බහාලීම.
05. මුද්දර ඇලවීම.
06. කවරයේ යැවිය යුතු ලිපි යොමුව ලිවීම.
07. තැපැල් පෙට්ටිය තුළට දැමීම.
08. ලියුම් කරු එම ලිපි තැපැල් කන්තෝරුවට ගෙන යාම.
09. ලියුම් බෙදන්නා එම ලියුම් තෝරා, අදාළ ලිපි යොමුවට/නිවෙස්වලට බෙදා හැරීම. .........ආදිය.

07) 01. රුස්වීමක් පැවැත්වෙන අවස්ථාවක.
02. තම අදහස් ඉදිරිපත් කිරීමේ දී.
03. ගුරුතුමිය ප්‍රශ්නයක් අසන විට පිළිතුරු ලබා දීම.
04. යහළුවෙකුට කරදරයක් වී ඇති විටදී.
05. බොහෝ කාලයකට පසු මිතුරක් හමු වූ විටදී. ........ආදී අවස්ථා වල.

08) 01. මනා සංයමයෙන් යුතුව කථා කිරීම.
02. අන් මත ඉවසීම.
03. දෙදෙනෙකු එක වර කතා නොකිරීම.
04. ප්‍රිය වචන පමණක් කතා කිරීම.
05. අන් අයගේ මත වලට ද ඇහුන්කන් දීම. .........ආදිය.

09) 01. පුවත්පත්. 04. දුරකථනය.
02. ගුවන්විදුලිය. 05. පරිගණකය/අන්තර්ජාලය.
03. රූපවාහිනිය. 06. පුස්තකාලය, පොත්පත්, පුවත්පත්. .........ආදිය.

10) 01. විද්‍යුත් තැපැල මගින් ලිපි සැකසීම.
02. ලිපි යැවීම.
03. පින්තූර යැවීම.
04. තැටි වීඩියෝ දර්ශන මගින් තොරතුරු සන්නිවේදනය කිරීම.
05. අන්තර්ජාලය.
06. හඬ තැපැල් (Voice mail). .........ආදිය.

11) -

12) 01. පුවත්පත් වාර්තා ඉදිරිපත් කිරීම.
02. ප්‍රවෘත්ති ඉදිරිපත් කිරීම, පුවත්පත් වාර්තා ඉදිරිපත් කිරීම, ක්‍රීඩා, වෛද්‍ය, ඉවුම් පිහුම්, විනෝදජන වැඩසටහන්.
03. යහළුවෝ, ඥාතීහු, රාජකාරි කටයුතු, දෙමවුපියෝ ඇමතීම.
04. ප්‍රවෘත්ති, තොරතුරු (විද්‍යුත් තැපැල), පින්තූර (ඡායාරූප), වීඩියෝ දර්ශන ආදිය නැරඹීම.

13) 01. ගුවන් විදුලිය, ප්‍රචාරක රථ, ශ්‍රවණ දුරකථන ඇමතුම්, සංවාද. .......... ආදිය.
02. දැන්වීම්, අත් පත්‍රිකා, පෝස්ටර්, පොත් පත්, පුවත් පත්, ෆැක්ස් පණිවිඩ, සඟරා. .......... ආදිය.
03. රූපවාහිනිය, පරිගණකය, දෘශ්‍ය දුරකථන ඇමතුම්, අන්තර්ජාලය. .......... ආදිය.

14) 01. දෙකකට. 02. විශාල, කුඩා.
03. විරුද්ධ. 04. විරුද්ධ.
05. මැද (කුඩා), පිටත (විශාල). 06. බිම වාඩි වූ දෙදෙනා

15) -